**කැළණි ගඟ ඉහලින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2017**

------------------------------------------------------------------------

කැළණි ගඟ ඉහලින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය (ජඅසනි) අතර 2014 මාර්තු 28 දින එළඹි අංක එස්එල් - පීIII දරන ණය ගිවිසුමේ 01 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය, මහාමාර්ග සහ නාවික කටයුතු අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉහල සංචලතා සම්බන්ධකයක් ලෙස කැළණි ගඟ ඉහලින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් වාහන තදබදය අවම කිරීම හා විසුරුවා හැරීම මෙන්ම එමඟින් කොළඹ නගරයේ ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම හා ආර්ථික සංවර්ධනය දිරිගැන්වීම සඳහා දායකවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 34,788 කට සමාන ජපන් යෙන් මිලියන 46,446 ක් වන අතර ඉන් රු.මිලියන 26,230 කට සමාන ජපන් යෙන් මිලියන 35,020 ක් ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2023 ජූලි 01 නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

------------------------------------------------------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා

පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය අනුව වසර 03 ක කාලයක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු අතර අර්ධ වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් වසරක කාලයක් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණු අතර සැලැස්ම යාවත්කාලීන කිරීමට පියවර ගෙන නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් - සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් - 2017 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | ජපාන යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපාන යෙන් මිලියන | රු. මිලියන | ජපාන යෙන් මිලියන | රු. මිලියන |
| ජඅසනි | 35,020 | 26,230 | 8,000.00 | 5,554.24 | 7,390.47 | 7,005.43 | 9,151.88 |
| ශ්‍රීලංර | 11,426 | 8,558 | 750.00 | 469.64 | 624.90 | 1,088.75 | 1,435.93 |
| **එකතුව** | **46,446** | **34,788** | **8,750.00** | **6,023.88** | **8,015.37** | **8,094.18** | **10,587.81** |

ඉහත සඳහන් විදේශීය ණය ලබාගැනීම් සහ ශ්‍රී ලංකා රජයෙන් ලද දායකත්වයට අමතරව, ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශීය බැංකුවකින් ලබාගත් ණය මුදලකින් රු. මිලියන 285.49 ක් ව්‍යාපෘතිය විසින් ආයෝජනය කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘති කටයුතු වලට ඇතුළත් පාලමේ විස්තරාත්මක සැලසුම්, විදුලි සම්ප්‍රේෂණ මාර්ගය නැවත ස්ථාපිත කිරීම, ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් පුහුණු කිරීමේ ආයතනය හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය නැවත ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව තිබුණි. එයින් පාලමේ සැලසුම් වැඩ සහ ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් පුහුණු කිරීමේ ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ 2017 දෙසැම්බර් 31 දිනට ඉලක්කගත ප්‍රගතිය සමඟ එකඟ විය. කෙසේ වුවද, අධිබලැති ගුවන් සම්ප්‍රේෂණ මාර්ග, අවශ්‍ය මාර්ග ඉඩකඩ ලබාදීමට හැකිවන පරිදි

භූගත රූහැන්වලට පරිවර්තනය කිරීම 2017 දෙසැම්බර් 31 දින වනවිට සියයය 20 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි.

තවද, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය සඳහා හෝමාගම හල්බරාවේ ගොඩනැගිලි ඉදිකිරිම් වැඩ ප්‍රදේශයේ මහජන විරෝධතා හේතුවෙන් අත්හැර දමා තිබුණි.

## 3.3 අනාර්ථික ගනුදෙනු

----------------------

ඉහතින් සඳහන් කළ පරිදි, නියමිත ගොඩනැඟිලි ඉදිකරමින් ශ්‍රී ලංකා පරමාණුක බල ශක්ති අධිකාරිය හල්බරාවට මාරු කිරීමට ව්‍යාපෘතිය පියවර ගෙන තිබුණි. කෙසේවුවද, ගොඩනැඟිලි පරිශ්‍රය වෙනස් කිරීමට සහ එය ඔරුගොඩවත්තෙහි ඉදිකිරීමට තිරණය කර තිබුණි. එම නිසා අත්තිවාරම් දැමීම හා පිරවීම් ආදි කටයුතු සඳහා දරන ලද රු. මිලියන 34 ක් නිශ්ඵල බවට පත් වී තිබුණි.

## 3.4 ඉඩම් අත්පත්කර ගැනීම් කටයුතු

-------------------------------------

ඉඩම් අත්පත් කර ගැනීමේ සැලසුම අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් කොටස් 948 ක් අත්පත් කර ගැනීමට යෝජිතව තිබුණු අතර එයින් ඉඩම් කොටස් 650 ක් පමණක් අත්පත් කර ගෙන තිබුණි. තවද, එම දිනය වන විට වන්දි මුදල් රු.මිලියන 714 ක් සහ පොළිය රු.මිලියන 44.51 ක් ගෙවා තිබුණි.